## කුෂ්ඨරාජගල - වැලිගම



මාතර නගරයේ සිට ගාල්ල මාර්ගයේ මාතර සිට 20km දුරින් පිහිටා ඇත.

අවලෝකිතේශ්වර පිළිරුවකි- මහායානික සම්ප්‍රදාය නියෝජනය කරන ක්‍රි.ව 6 -7 වන සියවසට අයත් ප්‍රතිමාවකි. ප්‍රතිමාවේ උස 1383cm පළල 102cm

## දෙනිපිටිය නුගරුක



වැලිගම-අකුරැස්ස මාර්ගයේ වැලිගම නගරයේ සිට කිලෝ මීටර් 5ක් දුරින් පිහිටා ඇත.

ගජමන් නෝනා කිවිදිය විසින් පද්‍ය රචනා කර ඇති බව සඳහන් වේ. මෙම ස්ථානයේ පිහිටි නුගරුක ඉතා පැරණිය.

## වැව්රුකන්නල රජමහා විහාරය



මාතර නගරයේ සිට බෙලිඅත්ත මාර්ගයේ මාතර සිට 23km දුරින් පිහිටා ඇත.

## ගොඩපිටිය රජමහා විහාරය

අකුරැස්ස සියඹලාගොඩ පාරේ අකුරැස්සේ සිට 1 1/2km දුරින් පිහිටි සක්මන් බුදුපිළිමයක් සහිත විහාරයකි.

## නූපේ පැරණි වෙළඳ ගොඩනැගිල්ල



.

මාතර ගාල්ල පාරේ 2km පමණ දුරින් පිහිටා ඇත. ඕලන්ද යුගයේ මුල් කාලයට අයත් වේ. පෙති උළු සෙවිලි කර ඇත. රවුම් කුළුණු වහලයට ආධාරක වශයෙන් භාවිත කර ඇත.




මධ්‍යම සංස්කෘතික අරමුදල

රෝහණ සංස්කෘතික ප්‍රවර්ධන කලාපය

මාතර ව්‍යාපෘතිය

මාතර

# මාතර සංස්කෘතික උරුමය



මාතර නගරය ගම්පොළ යුගයේ V වන බුවනෙකබාහු (ක්‍රි.ව1392-1396) රාජ්‍යය සමයේ නිල්වලා ගඟ මුවදොර පිහිටවන ලදි.පරෙවි හා කෝකිල සංදේශවල වීරබාහු ඈපා විසින් මාතර නගරය කළ බවත් ගම්පොළ යුගයේ මහතොට ලෙසත්, මහනුවර යුගයේ දී මහාතිත්ථ ලෙසත් පෘතුගීසින් මාතර ලෙසත් හඳුන්වා තිබේ. ක්‍රි.ව1606 දී අඳින ලද සිතියමේ මට්රේ matvre සැම්සන් ( ප්‍රංශ ජාතිකයා ක්‍රි.ව.1651) අඳින ලද සිතියමේ මතුරේ mature බැලඩෝල්ගේ ක්‍රි.ව.1677 දී අඳින ලද සිතියමේ මතුර Mathura රොබට් නොක්ස් ක්‍රි.ව.1681 අඳින ලද සිතියමේ මතුර Mathura ක්‍රි.ව.1597 දී දොන් ජුවාන් ධර්මපාලගෙන් මාතර දිසාව පෘතුගිසින් විසින් අත්පත් කර ගන්නා ලදි ක්‍රි.ව.1656 දී ලන්දේසින්ටද ඉන් පසුව ඉංග්‍රීසීන් අතට ද පත්විය.